පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක : 2025/05 (i)

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2025.09. 25

සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාවේ ප්‍රසම්පාදන කටයුතු වලට අදාල මූල්‍ය රීති සංශෝධනය කිරීම</u>**

උක්ත හිසින් යුතු අංක 2025/05 දරණ 2025/03/11 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ ඇමුණුම 01 ලෙස අමුණා ඇති, ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.05.27 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇති, උතුරු මැද පළාත් සභාවේ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 01 වන කොටස- ප්‍රසම්පාදන යටතේ වන, සංශෝධිත රීතීන්හි ඇතුළත් රීති අංක 422- ප්‍රසම්පාදන කමිටු සීමා සහ ඊට ආනුශාංගික වෙනත් විධිවිධාන මීට අමුණා ඇති වගු අංක 01, 02, 03, 04 හා 05 හි දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ. එම පරිච්ඡේදයේ 01 කොටස යටතේ වන අනෙකුත් විධිවිධාන ඒ ආකාරයටම බලපැවැත්වේ.

02. මෙම චක්‍රලේඛය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කරනු ලබන අතර මෙහි ඇතුළත් විධිවිධාන 2025.09.01 දින සිට බලපැවැත්වේ.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත් :

01. විගණකාධිපති - දැ.පි.

02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.

වගු අංක 01

රීති 422.1

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.9 | | |
|---|---|---|
| කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරිම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන් | | |
| භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (මාර්ගෝපදේශ 3.1.1, 3.1.2, 3.1.3, 3.1.4), සෘජු කොන්ත්‍රාත් පටිපාටිය (මාර්ගෝපදේශ 3.1.6) හෝ ස්වකීය සේවකයින් හා උපකරණ යොදා වැඩ කිරිම (මාර්ගෝපදේශ 3.1.7) අනුගමනය කිරීමේදී; | | |
| අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු |
| | අධිකාරී සීමාව | අධිකාරී සීමාව |
| ඉහල මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව/ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 100 ට වැඩි | රු.මි. 200 ට වැඩි |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 100 දක්වා | රු.මි. 200 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව<br>* (පළමු වර්ගීකරණය) | රු.මි. 60 දක්වා | රු.මි. 120 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව<br>**(දෙවන වර්ගීකරණය) | රු.මි. 20 දක්වා | රු.මි. 40 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 15 දක්වා | රු.මි. 30 දක්වා |

පළමු වර්ගීකරණය *

මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ 2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තාව අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක පළමුවන පන්තියේ නිලධාරියෙකු වන හෝ SL 1 - 2016 වැටුප් කාණ්ඩයේ රු. 47,615.00 ක හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන විධායක සේවයක පළමු වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු සඳහාය.

දෙවන වර්ගීකරණය **

මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ 2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා පොර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තා අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන හෝ විධායක සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු සඳහාය.

වගු අංක 02

රීති 422.2

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.9 (සබැදි) | | | |
|---|---|---|---|
| භාණ්ඩ, වැඩ සහ සේවා (උපදේශක සේවා නොවන) ප්‍රසම්පාදනය සඳහා වෙළඳපල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (මාර්ගෝපදේශ 3.1.5) | | | |
| අධිකාරිය | කැඳවිය යුතු අවම මිල ගණන් ප්‍රමාණය | අධිකාරී සීමාව (රු.මි.) | |
| | | ශ්‍රී ලංකා රජයේ අරමුදල් | විදේශ අරමුදල් |
| | | අධිකාරී සීමාව | අධිකාරී සීමාව |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 20 දක්වා | 20 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 10 දක්වා | 10 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 2 දක්වා | 2 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව<br>*පළමු වර්ගීකරණය | වැඩමුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 15 දක්වා | 15 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 8 දක්වා | 8 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 1 දක්වා | 01 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ ව්‍යාපෘති ප්‍ර සම්පාදන කමිටුව<br>** දෙවන වර්ගීකරණය | වැඩ මුද්‍රා තැබූ මිල ගණන් 05ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 05 දක්වා | 08 දක්වා |
| | භාණ්ඩ හා උපදේශකාත්මක සේවා නොවන සේවා<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 05 දක්වා | 08 දක්වා |
| | භාණ්ඩ හා උපදේශකාත්මක සේවා නොවන සේවා මුද්‍රා තැබූ මිල ගණන් 03 ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 01 දක්වා | 01 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | වැඩමුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 05 දක්වා | 08 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 05 දක්වා | 05 දක්වා |
| අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | වැඩමුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 0.5 දක්වා | 2 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම | 0.2 දක්වා | 1 දක්වා |

පළමු වර්ගීකරණය *

මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ 2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තාව අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක පළමුවන පන්තියේ නිලධාරියෙකු වන හෝ SL 1 - 2016 වැටුප් කාණ්ඩයේ රු. 47,615.00 ක හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන විධායක සේවයක පළමු වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු සඳහාය.

දෙවන වර්ගීකරණය **

මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ 2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා පොර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තා අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන හෝ විධායක සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු සඳහාය.

වගු අංක 03

රීති 422.3

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.9 (සබැඳි) | | |
|---|---|---|
| සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිල දී ගැනීම (මාර්ගෝපදේශ 3.1.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන) | | |
| අධිකාරිය | සම්පූර්ණ කල යුතු කරුණු | අධිකාරී සීමාව (රු.) |
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/ව්‍යා.අ. | වැඩ<br>• මාර්ගෝපදේශ 3.1.6 හි සදහන් අවශ්‍යතා සපුරාලන | රු. 500,000 දක්වා |
| | වැඩ<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිවැසුමදායි නොවන විට,<br>• ප්‍රසම්පාදනයේ පිරිවැසුමදායි බව පිළිබදව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර /ව්‍යා.අ. සහතික විය යුතුය<br>• අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර/ව්‍යා.අ.ගේ පෞද්ගලික අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතු අතර වෙනත් පුද්ගලයකු වෙත නොපැවරිය යුතුය. | රු. 200,000 දක්වා |
| | භාණ්ඩ හා උපදේශ සේවා නොවන සේවා ,<br>• මාර්ගෝපදේශ 3.1.6 හි සදහන් අවශ්‍යතා සපුරාලන<br>සෘජුවම වෙළඳපොළෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය,<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුමදායි නොවන විට,<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුමදායි බව පිළිබදව ප්‍ර.ග.නි/දෙ/ප්‍ර/ව්‍යා.අ/සහතික විය යුතුය<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර /ව්‍යා.අ.ගේ පෞද්ගලික අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය. | රු. 200,000 දක්වා<br><br>රු. 100,000 දක්වා |

| | | |
|---|---|---|
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/ව්‍යා.අ. | මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව,<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිවැසුම්දායි නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිවැසුම්දායි බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර/ව්‍යා.අ.සහතික විය යුතුය<br>• මෙම අධිකාරය දෙ.ප්‍ර/ව්‍යා.අ. සහතික විය යුතුය<br>• රු. 700,000/- ඉක්මවන අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු. 700,000 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අධිකාරී බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාල ඒකක/අංශ භාරව කටයුතු කරන නිලධාරීන් | එක් වතාවක දී එක් කටයුත්තක් සඳහා රු.20,000/- නොඉක්මවන පරිදි සුළු වටිනාකම්වලින් යුතු උපකරණ ඇතුළු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරන එවැනි මිල දී ගැනීම් වල එකතුව රු. 100,000/- නොඉක්මවිය යුතුය. | රු. 20,000 දක්වා |
| දෙ.ප්‍ර. විසින් අධිකාරී බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාල ඒකක/අංශ භාරව කටයුතු කරන නිළධාරීන් | මසකට රු. 100,000/- නොඉක්මවන මෝටර් වාහන අළුත්වැඩියා කිරිම | රු. 100,000 දක්වා |

වගු අංක 04

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව 2.9 (සබැඳි) | |
|---|---|
| ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන්, | |
| ශ්‍රී ලංකා රජයේ අරමුදලින් කරන ප්‍රසම්පාදනවලට අදාළව ඉතා හදිසි සහ ඉතා විශේෂ වූ කරුණු හේතුවෙන් නියමිත ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම අවශ්‍ය වන විට පහත නියම කර ඇති සීමාවන්ට යටත්ව ඒ සඳහා බලය දීමට නිසි අධිකාරියට හැකිය. එවන් අවස්ථාවලදී ඊට හේතු පැහැදිලි ව ලිඛිතව වාර්තා කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. | |
| නිසි අධිකාරිය | ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන් |
| | අධිකාරී සීමාව |
| අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියා (ඔහුගේ පෞද්ගලික අනුමැතිය ලැබිය යුතුය) | රු. 200,000 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 5 දක්වා |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 10 දක්වා |
| අමාත්‍ය මණ්ඩළය | රු.මි. 10 ට වැඩි |

| අනුමත කිරීමේ අධිකාරිය | |
|---|---|
| කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර, ප්‍රසම්පාදන කමිටුව විසින් කර ඇති නිර්දේශ/ නිර්ණයන් සඳහා පහත සඳහන් අධිකාරීන්ගේ (බලය පැවරීම සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 83 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව) අනුමැතිය ලබා ගත යුතුය. | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා. |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | |
| ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව | අමාත්‍ය මණ්ඩළය |

වගු අංක 05

422.5 මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීම (පළාත් මූල්‍ය රීති 20 හා 34 ට අනුකූලව)

| මුළු පිරිවැය ඇස්තමේන්තු වටිනාකම | නිසි අධිකාරිය |
|---|---|
| රු.මි.50 ට වැඩි | පළාත් සැලසුම් කමිටුව |
| රු.මි.50 දක්වා | ප්‍රධාන ලේකම් |
| රු.මි.15 දක්වා | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී |
| රු.මි.10 දක්වා | ගණන් දීමේ නිළධාරී |